
# කර්ම චක්‍රයෙන් ~ ධර්ම චක්‍රයට



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ධර්මග්‍රන්ථ ධර්මශ්‍රවණ මාධ්‍ය භාරය

## පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ

## විශේෂ නිවේදනය

2013.07.07 දින අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද 'පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය' මගින් පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද සවාමීන් වහන්සේ විසින් මේතාක් සම්පාදිත සහ ඉදිරියට සම්පාදනය කරනු ලබන සියලුම ධර්ම ග්‍රන්ථ ප්‍රකාශයට පත් කෙරෙන බවත් මින් පසු උන්වහන්සේගේ කිසිදු ග්‍රන්ථයක් කොළඹ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් ප්‍රකාශයට පත් නොකරෙන බවත් අප පාඨක පිරිස වෙත මෙයින් දන්වා සිටිමු.

මෙයට<br>
සසුන් ලැදි<br>
**පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය**

# කර්ම චක්‍රයෙන් - ධර්ම චක්‍රයට

කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු

**පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය**
**'පහන් කණුව'**
**කන්දේගෙදර,**
**දේවාලේගම**

**ISBN: 978-955-1255-47-3**

ප්‍රකාශනය
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය

2014

## ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

**පොත ලබාගත හැකි ස්ථාන:**

1. අනුර රූපසිංහ මහතා - 27, කොළඹ වීදිය, මහනුවර.
2. ස්ටැන්ලි සූරියාරච්චි මහතා - 25, කඩවීදිය, දේවාලේගම.
3. ඩී. ටී. වේරගල මහතා - 422, වැලිපාර, තලවතුගොඩ.
4. හේමමාලා ජයසිංහ මිය
29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
5. සංජීව නවරත්න මහතා
අංක 308/17 බී, කිරිවත්තුඩුව පාර, මාගම්මන, හෝමාගම.
6. හේමා රූපසිංහ මිය - 26, හැව්ලොක් පාර, ගාල්ල.
7. එස්. ඒ. ලයනල් මහතා
140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මණ පාර, මාතර.
8. සිරිමා විජේරත්න මිය - ඇලපාත, රත්නපුර.
9. ඒ.ජී. සරත් චන්ද්‍රරත්න මහතා
සමන්, ඇරැවුල හන්දිය, කණ්ඩලම පාර, දඹුල්ල.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ජේ.ඒ.ඩී. ජයමාන්න මහතා
ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
12. ආර්.ඒ. චන්දි රණසිංහ මිය
ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.

වෙබ් අඩවිය: www.seeingthroughthenet.net


මුද්‍රණය:
**කොලිටි ප්‍රින්ටර්ස්**
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 011-4 870 333

මනසමැ පෙරටුවේ
මනසට එන අරමුණට
මනසමැයි සෙටු වන්නේ
මනසින්මැ එය මැවුනේ

එහෙයින් පව්ටු මනසින්
කීයේ හෝ කළේ නම්
දුක ඇදී එයි පසුපස
රියැදි ගොනු පය අනුව සක මෙන්

මනසමැ පෙරටුවේ
මනසට එන අරමුණට
මනසමැයි සෙටු වන්නේ
මනසින්මැ එය මැවුනේ

එහෙයින් පහන් මනසින්
කීයේ හෝ කළේ නම්
සැප ඇදී එයි පසුපස
තමා හැර නොයන සෙවනැලි මෙන්

– ධ මම ප ද ය

# පටුන


| | පිටු |
|---|---|
| පෙරවදන | v |
| ප්‍රකාශක නිවේදනය | vii |
| අමා ගඟ | ix |
| කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට | 1 |
| පසුවදන | 9 |
| පාදක සටහන් | 13 |

## පෙරවදන

සසර ගමන කර්ම චක්‍රයෙනි. නිවන් ගමන ධර්ම චක්‍රයෙනි. කර්ම චක්‍රයේ පෙරළීම අතිශයින්ම බිහිසුණුය. ධර්ම චක්‍රයේ පෙරළීම අතිශයින්ම ශාන්තිදායකය. මහා කටුක ජීවිත සටනක් මැදින් මෙම චක්‍ර දෙකේම පෙරළීම පිළිබිඹු කරන අපූර්ව ආදර්ශවත් ආත්ම ප්‍රකා- ශනයක් මේ කුඩා පොත ගෙන එයි.

'නව' කතාවකට වඩා කෙටි වූද, 'කෙටි' කතාවකට වඩා දිගු වූද, කිසිසේත් ප්‍රබන්ධ කතාවක් නොවන මේ ආත්ම ප්‍රකාශනය අප ගුරුදේවයන් වහන්සේ වන මීතිරිගල නිස්සරණ වනයේ වැඩවිසූ කර්මස්ථානාචාර්‍ය මහෝපාධ්‍යාය අතිපූජ්‍ය මාතර ශ්‍රී ඥානාරාම මාහිමිප- ාණන් වහන්සේ වෙතින් 1987 වසරේදී කමටහන් උපදෙස් ලබා ගත් එක් උපාසිකාවකගේ ලිපියකින් උපුටා ගත් පිටු කීපයකි. උන්වහන්සේ ඇසුරෙහි විසූ දශක දෙකකට ආසන්න කාල සීමාව තුළ උන්වහන්සේ හමුවට පැමිණි සහ ලිපි මගින් උන්වහන්සේ ඇමතූ දේශීය හා විදේශීය උපාසක උපාසිකාවන්ගේ කර්මස්ථාන සාකච්ඡාවලට සහභාගී වීමේ සහ ලිපි යැවීමේ දුර්ලභ අවස්ථාව අපට ලැබුණි. යටකී උපාසිකාව උන්වහන්සේ වෙත එවූ දෙවන ලිපිය කෙතරම් ආශ්චර්යවත් ද යත් එයින් කොටසක් උපුටාගෙන අපගේ ලිපිගොනුවට එකතුකර ගතිමු.

විසිපස් වසරකට පසු ලිපිගොනුව තුළින් ඒ ලිපිය මෙසේ එළිදකින්නේ තවත් රැල්ලකට ආරාධනයක් වශයෙන් නොවන බව අවධාරණයෙන් කිවයුතුය. මෙහි එන පෞද්ගලික තොරතුරු ඇසුරෙන් අනිසි කුතුහලයක් ඇතිකරගෙන ඒ උපාසිකාව සොයා යාමට හෝ ඒ ගවේෂණය සඳහා හෝඩුවාවල් අහුලා ගැනීමට අප සොයා ඒමට හෝ මෙය කියවන පාඨකයින් නොපෙළඹිය යුතුය. තවමත් ජීවතුන් අතර සිටිතොත් ඇයටත් ඇයගේ ඥාති මිත්‍රාදීන්ටත් ඒ තුළින් ගැහැටක්ම සිදු වනු ඇත.

දොළොස් දහසක් වර්ෂ ඈත අතීතයට සිය මතකය විහිදු- වන, අලෝක වර්ෂ 500 ක් ඈත ග්‍රහලෝක සමඟ පණිවුඩ හුවමාරු කරගන්නා, අපූර්ව අධිමානසික ශක්තියක් ඇති මේ ශ්‍රේෂ්ඨ කාන්තාවගේ

අවංක නිහතමානී ආත්ම ප්‍රකාශනය, මෙය කියවන පාඨක ලෝකයාට කර්මයේ අසීමිත භයානකත්වයත් ධර්මයේ අසීමිත සැනසිල්ලත් විදහා දක්වන 'දේශනාවක්ම' වේවා! කාන්තාවක් සොයා ගිය භද්දවග්ගිය කුමාරවරුන්ට බුදුරදුන් දුන් ඔවදනට අනුව තම තමන් පිළිබඳ, ආත්ම ගවේෂණයක යෙදීමට මෙය ආරාධනාවක් ම වේවා!

'අත්තානං ගවෙසෙය්‍යාථ'- 'තමා සොයා යන්න.'

මෙයට සසුන් ලැදි,

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**
**(2557) 2013 සැප්තැම්බර්**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව', කන්දෙගෙදර
දේවාලේගම

# පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ

# ප්‍රකාශක නිවේදනය

දේවාලේගම, කන්දේගෙදර පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනවාසී පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීම උන්වහන්සේගේ අභිමතාර්ථයයි. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩ වෙසෙන ඓතිහාසික මහනුවර පුරවරය කේන්ද්‍රකොටගෙන අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද **'පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය'** එම උදාරතර අරමුණ ඉටු කිරීමට ඇප කැපවී සිටියි.

මේතාක් කොළඹ කේන්ද්‍රකොටගෙන පවත්වා ගෙන යන ලද **'ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය'** තුළින් මින් ඉදිරියට උන්වහන්සේගේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණය නොකෙරෙන අතර එයට අදාළව පැවති ග්‍රන්ථ මුද්‍රණය හා බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, මේතාක් මහනුවර **'ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය'** මගින් ඉටුකරන ලද ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ (seeingthroughthenet.net) වෙබ් අඩවිය පවත්වා ගෙන යාමත් මෙම **පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ** වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන්හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇති අතර ඒ පිළිබඳ සියලු විමසීම් පහත සඳහන් ලිපිනයට යොමු කිරීම මැනවි. ආධාර යොමු කිරීමට මෙම ගිණුම හැර සම්පත් බැංකුවේ **වෙනත් ගිණුමක් නොමැති බව** අප පාඨක පිරිස දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරමු.

මෙයට,
සසුන් ලැදි
**පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය**

**ආධාර මුදල් යොමු කිරීම:**
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය
ගිණුම් අංකය: 100761000202
සම්පත් බැංකුව - මහනුවර

**මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ විමසීම්:**

අනුර රූපසිංහ, 27, කොළඹ වීදිය, මහනුවර.
දුරකථන අංකය: 0777-801938
ඊමේල් ලිපිනය: pothgulgala@seeingthroughthenet.net

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ ''උතුරට'' හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා ''එදා-වේල'' සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

''ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය'' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ ''උතුරට'' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. ''නිවනේ නිවීම'' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී ''පහන් කණුව ධර්මදේශනා'' පොත් පෙළෙහි ''බර පැන'' දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. ''දෙන දේ පිරිසිදුවම දීමේ'' අදහසින් අමිල වූ දහම ඊට තිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම ''නැවත මුද්‍රණ'' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

''පොත් අලෙවිය'' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන ''දහම් පඬුර'' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් ''ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට'' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**''සබ්බදානං ධම්මදානං ජිනාති''**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

මෙයට,
සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

# කර්ම චක්‍රයෙන් - ධර්ම චක්‍රයට

ගරුතර නායක ස්වාමීන් වහන්සේ වෙත...

....... මේ ලිපිය ලිවීමට ප්‍රධාන හේතුව වූයේ මට ඔබ වහන්සේගෙන් ඇසිය යුතු වැදගත් කාරණාවක් නිසාය. මගේ සිත ඉතාම පැහැදිලිව, ප්‍රභාවත්ව, නිශ්චලව නිතර තිබෙන නමුදු එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය ප්‍රශ්නවලදී පාලනය කරගත නොහැකි කෝප ජනක අවස්ථාවන් සිතේ පැන නගී. එවිට මම මෝඩ, ශික්‍ෂණයක් නැති, දඩබ්බර ගැහැණියක් මෙන් මුරගාමි, මේ නිසා පවුලේ අප්‍රසාදයට ද, මිතුරන්ගේ අප්‍රසාදයට ද, අවට අයගේ අප්‍රසාදයට ද පත් වෙමි. මට මාවම එපා වේ. එහෙත් ඉතාම ඉක්මණින් යළිත් සිත 'කෝප පිස්සුවෙන්' මිදේ. යළිත් ප්‍රභාවත් වේ. මට සිද්ධියද අමතක වේ. මෙය හරියට නිශ්චල ජල තටාකයක, උඩින් හමා යන සුළං පහරක් වැනිය. සුළං පහරට කැළඹෙන ජලය සුළං පහර හමා ගිය පසු යළි නිසල වේ. කැළඹීම ගැඹුරු නැත.

මෙය මට බලනොපෑවාට මා අවට අයට තදින් බලපායි. මා මෙන් මෙය ඉක්මණින් අමතක කිරීමට ඔවුන් සතුටු නැත. ලේස්තිද නැත. මේ නිසා එදිනෙදා ජීවිතයේ මම සතුරන් සාදා ගනිමි. අප්‍රසාදයට පාත්‍ර වෙමි. මේ අප්‍රසාදජනක ගතිගුණයෙන් මට ගැලවීමට වුවමනාය.

ඒ සඳහා ඔබ වහන්සේගෙන් උපදේශයක් බලා-පොරොත්තු වෙමි. මෙවන් සිද්ධිවලින් පසු ප්‍රබලව මට ඒ

සිද්ධිය විස්තර කිරීමට හැක. මගේ දුර්වලතාව හොඳින් පෙනේ. දුර්වලතාව මතුවූ අන්දමද පෙනේ. එයට පැටලුනු අයගේ දුර්වලතාද පෙනේ. මා පාලනය කර ගන්නට තිබුනා නේද කියා සිතේ. ඒත් යළි යළිත් මම මේ වැරදි දේ කරමි. එය දූන් පුරුද්දක් මෙන් මතුවේ. වරකට මට මෙය පිටස්තර බලවේගයක්ද කියා ද සිතේ. පිටස්තර බලවේග යක් වුවත් එයට අසු වෙනවානම් එය මාගේ දුර්වලතාවකි.

මේ පැහැදිලි කිරීමට තවත් අතුරු කතාවක් මා ඔබ වහන්සේට කිව යුතුය. ස්වාමීන් වහන්ස, දොළොස් දහසක් වෂීයන් ඈතට මට පසුගිය ආත්ම පෙනේ. සියලුම ආත්ම නොව මේ ආත්මයට බලපාන කුසල අකුසල කර්ම කළ ආත්මයන්ය. ඉන් ඉතා ප්‍රබලව බලපාන ආත්ම තුනකි.

1. වසර දොළොස් දහසකට පෙර අත්ලාන්තික් සාගරයේ තිබූ ඉසුරුමත් රාජ්‍යයක රජකුමරියක් වූ ආත්මය.

2. ඉන් අනතුරුව ලංකාපුරයේ (ලක්දිව) ඉතාම නැණවත්, රූමත්, පිරිමියෙකු ලෙස දැඩි ප්‍රතාපයෙන් යුත්, තේජවන්ත රජකුමරියක වූ ආත්මය.

3. දෙවන පෑතිස් රජු කල අනුලා බිසවගේ පාරිචාරිකාවක ලෙස සිට ඇය හා මහණව, ශ්‍රී මහා බෝධීන්වහන්සේ ළඟ මහණ දම් පිරූ ආත්මය (මේ කුසලය බොහෝ කලකට බලපායි. සසර හරිමඟට ගෙන යන්නේ මේ කුසලය මතුපිට එන කුසල චිත්තයන් යැයි මට වැටහේ)

මේ ආත්මයේ මම 18 වසරක් තිස්සේ, අන්ත කටුක

මානසික පීඩා කරදර මැද හිරකාරියක සේ අප්‍රමාණ වද වේදනා විඳිමින් සිටිය ද, හැම දේකම වැරැද්ද, ප්‍රසිද්ධ අවමානය, තනිවීම, සමච්චලයට ලක්වීම, වැනි දේට මුහුණ දුනිමි. මේ, ලංකාපුරයේ රජකුමරියක වී සිටියදී කළ බරපතල පාපකර්මයේ අවසාන පියවරයි. ඒ කර්මය මා ගෙවා නිම කළද, තවමත් ටිකක් තිබේ. ගිනි පුපුරු නිවී ගියද ඇති උණුසුම මෙනි. මෙහි අන්ත දුක දකුණු ඉන්දියාවේ දේවාලයක දේවදාසියකව ගෙව්වෙමි. එය තිරිසනකු සේ වද වින්ද ආත්මයකි. මම අන් ස්ත්‍රියකගේ පුරුෂයාට ලොල් ව, පලිගැනීමක් වශයෙන් මාගේ රාජබලය ද දැඩි ප්‍රතාපයද යොදා , මාගේ සහෝදරයා ලවා (අපි සමපාලකයෝ වීමු) යටකී පතිභක්තිමත්, සියුමැලි, රූමත් කාන්තාව හිරකාරියක කළෙමි. ඈ බලවත් සේ කම්පාව, තනිව, භීතියෙන්, වද වින්දාය. ඈට වද දීම (මානසික වධ) මට විනෝදයක් විය. ඈ මේ නිසා සමාජ අවමානයට ලක්වූවාය. සැමියා ඇයටම පරිභව කර ඈ නෙරපා දැමීය. ඈ එවිට ගැබ්බරව සිටියා ය. තනිව ඒ දුක ද අවමානය ද වින්දාය. අසරණව මිය ගියා ය.

මම යසරඟට මේ ආත්මයේ ඒ කර්මයේ ශේෂය ගෙවුයෙමි. තනිවීමි, නින්දා ලැබීමි, සැමියා විසින් ද ඔහුගේ වර්ගයා විසින් ද දරුණු ලෙස පරිභව කරනු ලැබීමි, දරුවන් හා තනිව දුක් වින්දෙමි. නොකළ වැරදි වලට සමාජයේ ගර්හාවට ලක්වීමි. ප්‍රකටවම පරිභව ලැබීමි. හිරකාරියක වීමි. දරුවන් හා තනිව සිටිමි. (සැමියා මා පලවා හැරියේ ය).

මේ දුක් පීඩා එනවිට මම කුසල බලය (සිල්රැකීමේ

බලය) මතුවීමෙන් මෙයට හේතුව සොයන්නට වීමි. බෞද්ධ දර්ශනයේ ගැඹුර සෙවීමටත්, සත්‍යය සොයමින් යෑමටත්, කියවීමටත්, පින්දම් කිරීමටත්, ධර්මයට ඇලීමටත්, පුරුදු වීමි. මාගේ මනැසද, නැණැසද, ඇරුණේ ය. කර්ම වේගය කෙතරම් බරපතල ලෙස ගෙව්වත් අද මට ඒ ශේෂයක්වත් මනස් පීඩාවක් නැත. දුක් පීඩා මතක නැත, කිසිම වේදනාවක් නැත.

අත්ලාන්තික් සාගරයේ පුරවරයේ රජ කුමරියක වූ මගේ නම 'ඇනීහා' විය. අවුරුදු 14 දී වෛද්‍ය පූජකවරියක ලෙස පූජකාරාමයට ඇතුළු කරන ලදී. නිල් මහනෙල් තටාකයක් ඉදිරියේ හිඳ නීල කසිණයක් පුහුණුවීමට මට සිදුවිය. නීල කසිණ පුහුණු කළේ, ශල්‍යකර්මවලට භාජනය වන රෝගීන්ගේ තුවාල සනීප කිරීමට හා වේදනාව නැති කිරීමට මගේ මනසින් 'නීල ආලෝකධාරා' නිකුත් කිරීමටය. ඒ යුගයේ වෛද්‍ය විද්‍යාව මානසික බලය හා සම්බන්ධව කෙරුණේය . නීල අලෝකධාරා නිකුත් කිරීමට මට විශේෂ බලයක් තිබූ බැව්, අධිමානසික බල තිබූ පූජකවරු දැන ගත්හ. එහෙත් පුහුණු වූයේ අවුරුදු හතරක් පමණි. මට වයස අවුරුදු 18 දී පූජකාරාමයෙන් ද රටින් ද පැන ගියෙමි.

මේ ආත්මයේ මට මේ නිල් පාට දුටුවිටම සිත පහන් වේ. එකඟ වේ. ප්‍රභාවත් වේ. උද්වේගයෙන් පිම්බී යයි. සිත ශාන්ත වේ. නිවේ. නිල් මහනෙල් මල මට ඉතා ප්‍රියය. අහස් නිල ඉතා ප්‍රියය.

මේ ආත්ම තුන මා දැක්වූයේ, ඒ මේ ආත්මයට ඉතා සම්බන්ධ බැවිනි.

1. මට මතුවන 'කෝප පිස්සුව' මගේ අකුසල කර්මයේ කොටසක් ද?
2. නීල කසිණය යළි වැඩීමෙන් මගේ සිත නිවා ගත හැකි ද?

බොහෝ දේ ලිවීම ඔබවහන්සේට මහත් කරදර බව දනිමි. කරදර කරනවාට දෙපා නැමද සමාව ඉල්ලමි.

<u>ප.ලි.</u>

පසුගිය ආත්මවල දන හැඳින සිටි අය මට මේ ආත්මයේදී හඳුනාගත හැක. ළඟින්ම සිටින්නෝ කල්‍යාණ මිත්‍රයෝ ය. තවත් ළඟින් සිටින කොටසක් පරම හතුරෝය. මට මේ දෙකොටසම කෙරේ ඇත්තේ, එකම හැඟීමකි.

මේ හැර මේ සංඥා තලයට අයත් නැති නොපෙනෙන කල්‍යාණ මිත්‍රයෝ සිටිති. ඇතැම් ආත්ම (මට මතකයට නොඑන) ගැන ඔවුහු මට කියති. අවුරුදු දොළොස් දහසකට පෙර මා චාතුර්මහාරාජික දෙව්ලොවේ සිට පොළෝ තලයට ආ බවත්, යළිත් මේ ආත්මයෙන් පසු එහි එන බවත් මට දන්වා ඇත.

ඉදිරියේ ඇති ආත්ම දෙකක් මට පෙනේ. එකක් මොළය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු (ශල්‍ය) ලෙස උපත ලැබීම. ඉන්පසු ආත්මය මහණදම් පිරීම. මේ ආත්ම

දෙකම පිරිමි ආත්මය. ප්‍රබල කුශල බලපාන ආත්මයන් ය. මේ ආත්මයත් ඊළඟ ආත්මයත් අතර ලොකු පරතරයක් පෙනුනද, ඒ කාලයේ මා ඉන්නේ කොහේද කියා මට නොපෙනුනේ ය. දැන් මට දන්වා ඇති පරිදි ඒ චාතුර්මහා රාජිකයේ ය. මනස ඉතා පැහැදිලි විට ඔවුහු මට කතා කරති.

මේ හැර ආලෝක වර්ෂ 500 ක් ඈත මේ චක්‍රාවාට-යේම (වෘෂභ තාරකා මඬුල්ලේ හත්දින්නන් තරු පොකුරේ) තාරකාවක් වටා ඇති ග්‍රහලෝකයකින් එන පණිවුඩ මට ලැබේ. තව වසර දහයකින් ඒ ග්‍රහලොවට මට එන්නට පවා හැකිවේයැයි ඔවුහු මට කියති. අධිමානසික තරංග මත ගමන් කිරීමේ ශක්තිය මේ ග්‍රහලොවේ වැසියන්ට තිබේ. ඔවුහු විද්‍යාඥානයෙන්ද, මානසික බලයෙන්ද අතිප්‍රබල ය. මනැස් සංඥාවෙන් කතා කරති. මේ කල්පයේ වැදගත් සිදුවීම් ඔවුන් 'ටෙලිවිෂන්' සේ චිත්‍රගත කර ඇත. ඒ අතර ගෞතම බුදුන්වහන්සේගේ ධර්ම දේශනා ඇතැම් කොටස් එහි ඇත.

මේ ගැන සෙවූ මට තාරකා විද්‍යාඥයින් මේ තරු පොකුරේ සෞරග්‍රහ මණ්ඩලයක් තිබෙන බවට සැක කරන බව තාරකා විද්‍යා පොත්වල දක්නට ලැබුණි. විද්‍යාඥයින් සැක පහළ කරන්නේ තර්කානුකූලව ඔප්පු කළ හැකි සාධක ඇත්නම් පමණි. හේතු ඇත්නම් පමණි.

මම ද මේ ගැන විමසිලිමත් වෙමි. ඔවුන් ආශ්‍රයට සුදුසු ප්‍රබල මනස් ඇතියවුන් බැවින් ඒ මට මහත්

ප්‍රීතියකි. පසුගිය කාලයේ මාස හතරක් තිස්සේ මේ සංඥා මට ලැබුනේ ය. දැන් ඒවා නැවතී ඇත. මගේ කර්ම වේගය හීන වී මගේ මනැස පැහැදිලි වනතෙක් මට සංඥා දීමට ඔවුන් බලා සිට ඇත.

මේ සියල්ල මට අරුම විශේෂ සිද්ධීන් ලෙස නොදැනේ. මේ සංසාරය විහිදී යන දුර පමණ-ක් පැහැදිලි වේ. දැන් මහ පොළවේ සිටියත්, එන ආත්මයේ චාතුර්මහාරාජිකයේ උපන්නත්, මට එකසේ දැනේ. විශේෂ ප්‍රීතියක් නැත. මේ සියල්ලම මනස නම් මායාමය බලවේගය මවන මායාවන් නොවේ ද?

මගේ එකම අධ්‍යාශයත්, උවමනාවත් සර්වඥතා ඥානය ප්‍රත්‍යක්ෂ කිරීම පමණි. මේ මගේ අන්තිම ස්ත්‍රී ආත්මයයි. සසර බරපතල පව් මම මේ ආත්මයේ දී ගෙවා නිම කරමි. ඉන්පසු සසර ඉදිරිමග පැහැදිලි විසල් ඍජු ගමන් මගක් ලෙස මට දැනේ. බාධක කිසිත් නැත. මගේ සිත පැහැදිලි අහසක් මෙන් විශාලව පැතිරී යයි. සියල්ල එක නිමේෂයකට එක්වර මම දකිමි. ඉන්පසු යළිත් සිත වැසී නිශ්චල වෙයි. මෙය ඉතා ප්‍රබලව දැන් මට දැනේ.

මේ ගමන් මගට සුදුසු ධර්ම දානය දෙන ලෙස මම ඔබවහන්සේගෙන් ඉල්ලා සිටිමි. සසර මේ සන්ධි ස්ථාන-යේදී මාර්ගෝපදේශකයා ඔබවහන්සේම විය යුතුය.

මේ දීර්ඝ ලිපි ලියා ඔබවහන්සේට කරදර කරනවාට

දහස්වරක් සමාව අයදිමි.

<u>ප.ලි.</u>

මේ ලිපිය ලියූ පසු මට කරුණක් නිරවුල් විය. කෝප පිස්සුව බරපතල කර්මය කළ ආත්මයේ තිබූ චරිත ලක්ෂණයකි. එය අද මට මා කෙරේම නින්දා පමුණුවන, ගර්භාවට ලක් කෙරෙන ආයුධයක් වී ඇත. එකල එය අනුන් යටත් කළ ආයුධයක් විය. කර්ම පලදෙන හැටි! දැන් මා මෙයට ප්‍රතිවිරුද්ධව නැගී කර්ම වේගය සිඳිය යුතුය. එය කරන්නේ කෙසේ ද? මෙය මතුවන්නේ මා නොසිතූ විටය. හදිසි කුණාටුවක් මෙනි.

සසර ගමනේ මගේ ස්ත්‍රී භාවය නිමා වූ අන්දම ඔබවහන්සේ හමුවූ විටක කියමි. එය කර්ම වේගය පිළිබඳ

## පසුවදන

ලිපියෙහි අවසන් වැකියෙන් හැඟවෙන ඒ කර්ම වේග පිළිබඳ විචිත්‍ර කතාව ඇසීමට අපට අවස්ථාව නොලැබුනේ ඒ උපාසිකාව මාහිමිපාණන් බැහැදැකීමට ලබාගත් දිනයේ ඇය නොපැමිණී හෙයිනි. පැමිණීමට නොහැකි වීමේ හේතුව හෝ අන් දිනක පැමිණෙන බව හෝ දන්වා එවතියි මාහිමිපාණන් වහන්සේ මෙන්ම මේ ලිපිය ගැන දැනගත් අප කීප නමක් බලාපොරොත්තුවෙන් සිටි නමුත් එවැනි ලිපියක් නොලැබුණි. සසර ගමනේ මේ සන්ධි ස්ථානයේදී මාර්ගෝපදේශකයා වශයෙන් ඇය හඳු-න්වා ඇති අප ගුරුදේවයන් වහන්සේ අපවත් වන තුරුත් ඇය නොපැමිණියේ කිසියම් කර්ම වේගයක් හරස්වීමෙන් දැයි නොදනිමු.

කෙසේ වෙතත්, මේ අසම්පූර්ණ ජීවිත කතාවෙන් සෑහීමකට පත් වී මෙය තුළින් තම ජීවිත යහමඟට යොමු කර ගැනීමට පාඨකයින් උනන්දුවනු ඇතැයි සිතමු. කර්මය හා කර්ම විපාක ගැන සැක කරන, ධර්මය හා ධර්මයේ උත්කෘෂ්ට පරමාර්ථ ගැන නොඅදහන පාඨකයින්ට පවා තම දෘෂ්ටිය ඍජු කර ගැනීමට මේ ජීවිත කතාව උපකාරීවනු ඇත. ''පැමිණි දුක් පැණි රසයි'' යන කියමනට අනුව මේ උදාර මාතාව 'පැමිණි දුක් දහම් රසයි' කී ලෙසක්

ඇගේ වදන් වලින් ඉඟි කරයි. කර්ම චක්‍රයේ පීඩනය වෙස් වළාගත් ආශිර්වාදයක් කරගත් ඇය තම කර්ම දායාදය පිළිගෙන අනුනට දොස් නොපවරන මැදහත් බවක් තම ජීවන දර්ශනයට ද එකතු කරගෙන ඇත.

මේ උපාසිකාවට නින්දා කළ, පරිභව කළ, ගර්හා කළ ඥාතිවර්ගයා හා අවට සමාජය ඇයට බලපාන කර්ම ශක්තිය හෝ ඇය තුළ ඇති ප්‍රබල ධර්ම ශක්තිය හෝ දැන නොසිටි බව පෙනේ. අවිද්‍යාව තුළින් කර්ම නූල් බෝලය ගැට වැටෙන හැටි! ස්ත්‍රී භාවය හා පුරුෂ භාවය තුන්වන ශික්ෂාපදය හා බැඳුනු කර්ම දායාදයක් පමණක් බව ඇගේ චරිත කතාවෙන් පැහැදිලි වේ. ඇය තුළ මෝදුවී එන පෞරුෂය වාග් විලාසය තුළින් ප්‍රකට වේ. කුශලා කුශල කර්ම වේග හමුවේ අෂටලෝක ධර්මයෙන් නොසැලී සිටීමට ඇය දරා ඇති උත්සාහය අතිශය ආදර්ශවත් ය.

ඨාන සූත්‍රයේදී[1] බුදුරජාණන් වහන්සේ ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින්, ගිහියකු විසින් හෝ පැවිද්දකු විසින්, නිතර ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බැව් වදාළ කර්‍මය පිළිබඳ ධර්‍මතාව මේ උපාසිකාව මැනවින් වටහා ගෙන ඇත. කර්මය තමාගේ බව පිළිගෙන (කම්මස්සකොම්හි) තම වගකීම අනුන්ට නොපවරා තම නියම දායාදය (කම්ම දායාදො) නියම බන්ධුවරයා (කම්ම බන්ධු) නියම පිළිසරණ (කම්ම පටිසරණො) හැඳින ගත්තා ය. අනුනට දොස් පැවරීමෙන්, ද්වේශ කිරීමෙන්, පලි ගැනීමෙන්, 'කර්‍ම නූල් බෝලය' අවුල් කර නොගැනීමට ප්‍රවේසම් වූවා ය.

එමෙන්ම උපනිසා සූත්‍රයේදී[2] බුදුරදුන් ගෙනහැර දක්වූ න්‍යායයට අනුව තම ජීවිතය තුළ ධර්ම චක්‍රය කරකැවීමට දුක පිළිබඳ ප්‍රත්‍යක්ෂ අවබෝධය පිහිට කරගත්තා ය. 'දුක්ඛූපනිසා සද්ධා' (ශ්‍රද්ධාව දුක උපනිශ්‍රය කොට ඇත.) යන ධර්මතාවට මේ ජීවිත කතාව කදිම සාධකයකි. නියම ශ්‍රද්ධාවේ උල්පත සසර දුක පිළිබඳ ගැඹුරු අවබෝධ-යයි. උපනිසා සූත්‍රයෙහි එන 'චක්‍රාකාර පටිච්ච සමුප්පාද දේශනාව' බොහෝ උගතුන්ගේ විශේෂ අවධානයට ලක් වී ඇත. වඩා ප්‍රකට 'අවිජ්ජා පච්චයා සංඛාරා' ආදී අංග දොළොසේ පටිච්ච සමුප්පාද දේශනාව[3] තුළ අනුලෝම වාරයක් සහ පටිලෝම වාරයක් දක්වෙයි. අවිද්‍යා ප්‍රත්‍ය-යෙන් සංස්කාර වේ යයි අනුලෝම වාරයේදී කියැවෙන අතර පටිලෝම වාරයේදී අවිද්‍යාවගේම නිරවශේෂ නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේයැ' යි කියැවේ. එහෙත් උපනිසා සූත්‍රයේදී 'අවිද්‍යාව සංස්කාරය-නට උපනිශ්‍රයවන බව' (අවිජ්ජූපනිසා සංඛාරා) දක්වා ඒ න්‍යායය අනුවම පටිලෝම වාරයක් වෙනුවට දුක ශ්‍රද්ධා-වට උපනිශ්‍රය වන බව (දුක්ඛූපනිසා සද්ධා) දක්වා ඇත. ශ්‍රද්ධාවෙන් ඇරඹෙන ඒ ධර්ම පරම්පරාව ප්‍රමෝදය, ප්‍රීතිය, ප්‍රශ්‍රබ්ධිය, සුඛය, සමාධිය, යථාභූතඥාන දර්ශනය, නිර්වේදය, විරාගය, විමුක්තිය, විමුක්තිඥාන දර්ශනය දක්-වා විහිදයෙයි. අප කතානායිකාවගේ ජීවිත පරිවර්තනයද උපනිසා සූත්‍රය සිහිගන්වන සුළුය. වෙනසකට ඇත්තේ එහි ඉලක්කය අර්හත් මාර්ග ඥානය වෙනුවට සර්වඥතා ඥානය වීමයි.

මේ 'පසුවදන' පුණ්‍යානුමෝදනාවකින්ම අවසන් කළ යුතු යැයි හැඟේ. අසාමාන්‍ය පාරමී ශක්තියක් ඇති මේ උදාර කාන්තාව තවමත් 'මේ මහ පොළව මතද, නැතහොත් චාතුර්මහාරාජිකයේදැයි නොදනිමු. එතුමිය කොහි සිටියත්, කර්‍ම චක්‍රයේ පැටලී ධර්‍ම චක්‍රය නොතකන ලෝකයා වෙනුවෙන් අප කරන මේ ධර්‍මදානය තුළින් ජනිත කුශල ශක්තිය අනුමෝදන් වී 'සසර ඉදිරිමග පැහැදිලි විසල් සෘජු ගමන් මගක්, කරගෙන තම උත්කෘෂ්ට සම්බෝධි ප්‍රාර්‍ථනා ඉෂ්ට සිද්ධ කර ගනීවා' යි පතමු.

## පාදක සටහන්

1. '........කම්මස්සකොම්හි කම්මදායාදො කම්ම යොනි කම්ම බන්ධු කම්ම පටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං ඉත්ථියා වා පුරිසෙන වා ගහට්ඨෙන වා පබ්බජිතෙන වා.'

- ඨාන සු. අංනි. 3 - 112

(බු.ජ.ත්‍රි.)

'කර්මය ස්වකීය කොට ඇත්තෙමි, කර්මය දායාද කොට ඇත්තෙමි. කර්මය උත්පත්ති කාරණ කොට ඇත්තෙමි. කර්මය බන්ධු කොට ඇත්තෙමි, කර්මය පිළිසරණ කොට ඇත්තෙමි, කල්‍යාණ වූ හෝ පාපවූ හෝ යම් කර්මයක් කරන්නෙම් නම් එය දායාද කොට ඇත්තෙක් වන්නෙමි' යි ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ පැවිද්දකු විසින් නිතර ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය.

2. 'එවමෙව ඛො භික්ඛවෙ අවිජ්ජූපනිසා සංඛාරා සංඛාරූපනිසං විඤ්ඤාණං, විඤ්ඤාණූපනිසං නාමරූපං, නාමරූපූපනිසං සළායතනං, සළායතනූපනිසො ඵස්සො, ඵස්සූපනිසා වෙදනා, වෙදනූපනිසා තණ්හා, තණ්හූපනිසං උපාදානං, උපාදානූපනිසො භවො. භවූපනිසා ජාති, ජාතූපනිසං දුක්ඛං, දුක්ඛූපනිසො සමාධි. සමාධූපනිසං යථාභූත ඤාණදස්සනං, යථාභූත

ඤාණදස්සනූපනිසා නිබ්බිදා, නිබ්බිදූපනිසො විරාගො,
විරාගූපනිසා විමුත්ති, විමුත්තූ පනිසං ඛයෙ ඤාණං'

- උපනිස සූ. සං.
නි 2 -50

'මහණෙනි, එපරිද්දෙන්ම සංස්කාරයෝ අවිද්‍යාව උපනිශ්‍රය කොට ඇත්තාහ. විඥානය සංස්කාර උපනිශ්‍රය කොට ඇත්තේය. නාමරූප විඥානය උපනිශ්‍රය කොට ඇත්තේය. ෂඩායතනය නාමරූප උපනිශ්‍රය කොට ඇත්තේය. ස්පර්ශය ෂඩායතනය උපනිශ්‍රය කොට ඇත්තේය. වේදනාව ස්පර්ශය උපනිශ්‍රය කොට ඇත්තේ ය. තෘෂ්ණාව වේදනාව උපනිශ්‍රය කොට ඇත්තේය. උපාදානය තෘෂ්ණාව උපනිශ්‍රය කොට ඇත්තේය. භවය උපාදානය. උපනිශ්‍රය කොට ඇත්තේය. ජාතිය භවය උපනිශ්‍රය කොට ඇත්තේය. දුක්ඛය ජාතිය උපනිශ්‍රය කොට ඇත්තේය. ශ්‍රද්ධාව දුක්ඛය උපනිශ්‍රය කොට ඇත්තේය. ප්‍රමෝද්‍යය ශ්‍රද්ධාව උපනිශ්‍රය කොට ඇත්තේය. ප්‍රීතිය ප්‍රමෝද්‍යය උපනිශ්‍රය කොට ඇත්තේය. පස්සද්ධිය ප්‍රීතිය උපනිශ්‍රය කොට ඇත්තේය. සුඛය පස්සද්ධිය උපනිශ්‍රය කොට ඇත්තේය. සමාධිය සුඛය උපනිශ්‍රය කොට ඇත්තේය. යථාභූතඥාන දර්ශනය සමාධිය උපනිශ්‍රය කොට ඇත්තේය. නිර්වේදය යථාභූතඥාන දර්ශනය උපනිශ්‍රය කොට ඇත්තේය. විරාගය නිර්වේදය උපනිශ්‍රය කොට ඇත්තේය. විමුක්තිය විරාගය උපනිශ්‍රය කොට ඇත්තේය. ප්‍රත්‍යවේක්ෂාඥානය විමුක්තිය උපනිශ්‍රය කොට ඇත්තේය.

3. ‘ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. යදිදං අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාර නිරොධො සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භවනිරොධො, භවනිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, ඵවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

- බහුධාතුක සූ.ම.නි. 3-198

‘මෙය ඇති කල්හි මෙය වෙයි මෙහි හට ගැනීමෙන් මෙය හටගනියි. මෙය නැති කල්හි මෙය නොවෙයි. මෙහි නිරුද්ධ වීමෙන් මෙය නිරුද්ධ වෙයි. එනම් අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය වෙයි. විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වෙයි. නාමරූප

ප්‍රත්‍යයෙන් ෂඩායතනය වෙයි. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව වෙයි. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදාන වෙයි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. ජාති ප්‍රත්‍යයෙන්, ජරාමරණ සෝක පරිදේව දුක්ඛ දෝමනස්සුපායාසයෝ හට ගනිත්.

අවිද්‍යාවගේම නිරවශේෂ විරාග නිරෝධයෙ- න් සංස්කාර නිරෝධය වෙයි. සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය වෙයි. විඥාන නිරෝධයෙන් නාමරූප නිරෝධය වෙයි. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වෙයි. ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වෙයි. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වෙයි. වේදනා නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වෙයි. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වෙයි. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වෙයි. භව නිරෝධයෙන් ජාති නිරෝධය වෙයි. ජාති නිරෝධයෙන් ජරාමරණසෝක පරි- දේව දුක්ඛ දෝමනස්සුපායාසයෝ නිරුද්ධ වෙත්. මෙසේ මේ තනිකර දුක් ගොඩෙහි නිරෝධය වෙයි.

# කතු හිමියන්ගේ සිංහල කෘති

* 1. උත්තරීතර හුදෙකලාව - (මුල් මුද්‍රණය) දම්සක් අංක 172/173 - (1990)
 -එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
2. පින් රුකෙක මහිම (1988)
3. විදසුන් උපදෙස් (1997)
4. නිවනේ නිවීම - පළමු වෙළුම (1997)
5. නිවනේ නිවීම - දෙවන වෙළුම (1998)
6. නිවනේ නිවීම - තෙවන වෙළුම (1998)
7. නිවනේ නිවීම - සිවුවන වෙළුම (1998)
8. නිවනේ නිවීම - පස්වන වෙළුම (1999)
9. නිවනේ නිවීම - සයවන වෙළුම (1999)
10. නිවනේ නිවීම - සත්වන වෙළුම (1999)
11. නිවනේ නිවීම - අටවන වෙළුම (2000)
12. නිවනේ නිවීම - නවවන වෙළුම (2001)
13. නිවනේ නිවීම - දසවන වෙළුම (2002)
14. නිවනේ නිවීම - එකොළොස්වන වෙළුම (2004)
15. නිවනේ නිවීම - පුස්තකාල මුද්‍රණය - ප්‍රථම භාගය - (1-6 වෙළුම්) (2000)
16. නිවනේ නිවීම - පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්) (2010)
17. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම (1999)
18. පහන් කණුව ධර්ම දේශනා - 2- වෙළුම (2000)
19. පහන් කණුව ධර්ම දේශනා - 3- වෙළුම (2001)
20. පහන් කණුව ධර්ම දේශනා - 4- වෙළුම (2003)
21. පහන් කණුව ධර්ම දේශනා - 5- වෙළුම (2005)
22. පහන් කණුව ධර්ම දේශනා - 6- වෙළුම (2006)
23. පහන් කණුව ධර්ම දේශනා - 7- වෙළුම (2009)
24. පහන් කණුව ධර්ම දේශනා - 8- වෙළුම (2012)
25. හිතක මහිම - 1 (1999)
26. හිතක මහිම - 2 (2003)
27. හිතක මහිම - 3 (2012)
28. හිත තැනීම (2000)
29. පැවැත්ම හා නැවැත්ම (2000)
30. ඇති හැටි දැක්ම (2001)
31. දිවි කතරේ සැඳෑ අඳුර (2001)
32. කය අනුව ගිය සිහිය (2001)
33. මා-පිය උවැටන (2002)
34. ප්‍රතිපත්ති පූජාව (2003)
35. චලන චිත්‍රය (2004)
36. දිය සුළිය (2005)
37. අබිනික්මන (2003)
38. බුදු සමය පුද්ගලයා හා සමාජය (2009)
39. මනසේ මායාව (2010)
40. භාවනා මාර්ගය (2011)
41. සසුන් පිළිවෙත (2011)
42. පිළිවෙතින් පිළිවෙතට (2011)
43. තිසරණ මහිම (2012)
44. කයේ කතාව (2012)
45. මෙත් සිතේ විමුක්තිය (2012)
46. පටිච්ච සමුප්පාද ධර්මය - 1 වෙළුම (2012)
47. පටිච්ච සමුප්පාද ධර්මය - 2 වෙළුම (2014)
48. පටිච්ච සමුප්පාද ධර්මය - 3 වෙළුම (2014)
49. පටිච්ච සමුප්පාද ධර්මය - 4 වෙළුම (2014)
50. සක්මනේ නිවන (2012)
51. තපෝ ගුණමහිම (2013)
52. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට (2013)

* බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර.

# කතු හිමියන්ගේ ඉංග්‍රීසි කෘති

| | | | |
|---|---|---|---|
| * 1. | Concept and Reality in Early Buddhist Thought | | (1971) |
| | - do - | D. G. M. B. Edition | (2012) |
| * 2. | Samyutta Nikaya - An Anthology, Part II - Wheel No, 183/185 - | | (1972) |
| | - do - | D. G. M. B. Edition | (2009) |
| * 3. | Ideal Solitude - Wheel No, 188 - | | (1973) |
| * 4. | The Magic of the Mind - | | (1974) |
| | - do - | D. G. M. B. Edition | (2007) |
| 5. | Towards Calm and Insight - | | (1991) |
| | - do - | D. G. M. B. Edition | (1998) |
| 6. | From Topsy - turvydom to Wisdom - Volume 1 | - | (2003) |
| 7. | From Topsy - turvydom to Wisdom - Volume II | - | (2012) |
| 8. | Seeing Through | | (1999) |
| 9. | Towards A Better World | | (2000) |
| 10. | Nibbana - The Mind Stilled - Volume I | - | (2003) |
| 11. | Nibbana - The Mind Stilled - Volume II | - | (2005) |
| 12. | Nibbana - The Mind Stilled - Volume III | - | (2005) |
| 13. | Nibbana - The Mind Stilled - Volume IV | - | (2006) |
| 14. | Nibbana - The Mind Stilled - Volume V | - | (2007) |
| 15. | Nibbana - The Mind Stilled - Volume VI | - | (2010) |
| 16. | Nibbana - The Mind Stilled - Volume VII | - | (2012) |
| 17. | Nibbana - The Mind Stilled - Library Edition | - | (2015) |
| 18. | Nibbana and The Fire Simile | | (2010) |
| 19. | 'A Majestic Tree of Merit' | | (2012) |
| 20. | The End of the World in Buddhist Perspective | | (2014) |

* Buddhist Publication Society, P.O. Box, 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්
**අනුර රූපසිංහ මහතා**
අංකඃ 27, කොළඹ වීදිය, මහනුවර.
දුරකථනයඃ 081-2232376

## පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ

## විශේෂ නිවේදනය

2013.07.07 දින අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද 'පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය' මගින් පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද සවාමීන් වහන්සේ විසින් මේතාක් සම්පාදිත සහ ඉදිරියට සම්පාදනය කරනු ලබන සියලුම ධර්ම ග්‍රන්ථ ප්‍රකාශයට පත් කෙරෙන බවත් මින් පසු උන්වහන්සේගේ කිසිදු ග්‍රන්ථයක් කොළඹ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් ප්‍රකාශයට පත් නොකරෙන බවත් අප පාඨක පිරිස වෙත මෙයින් දන්වා සිටිමු.

මෙයට
සසුන් ලැදි
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය